**රාජ්‍ය දැව සංස්ථාව - 2022**

**-----------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

රාජ්‍ය දැව සංස්ථාවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සංස්ථාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සංස්ථාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සංස්ථාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සංස්ථාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සංස්ථාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සංස්ථාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථය පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සංස්ථාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව,
- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සංස්ථාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සංස්ථාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය**

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරිබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ. අදාළ වන විගණන නිරීක්ෂණ පහත සඳහන් මාතෘකා යටතේ ඇතුළත් කර ඇත.

**1.5.2 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 16 හි 31 හා 51 ඡේද අනුව වාර්තාකරන දිනට වත්කම්වල සාධාරණ අගය මූල්‍ය ප්‍රකාශනවලින් නිරූපණය වන ආකාරයට වත්කම් නැවත තක්සේරු කළ යුතු අතර වත්කම් සුන්බුන් වටිනාකම සහ ප්‍රයෝජනවත් ආයු කාලය අවම වශයෙන් සෑම මූල්‍ය වර්ෂයකදීම සමාලෝචනය කළ යුතුය. එසේ වුවද, 1968 වර්ෂයේ සිට රාජ්‍ය දැව සංස්ථාවට පවරාගෙන රු.91,657,617 ක් වශයෙන් මූල්‍ය ප්‍රකාශනවලින් නිරූපණය කරන ඉඩම්වල වර්තමාන වෙළඳපළ වටිනාකම සහ තවදුරටත් භාවිතයේ පවතින සම්පූර්ණයෙන් ක්ෂය වූ පිරිවැය රු.844,535,194 ක් වූ වටිනාකමකින් යුත් දේපළ පිරියත හා උපකරණවල ඵලදායී ජීවිත කාලය නැවත තක්සේරු කිරීමට සංස්ථාව කටයුතු කර නොතිබුණි. | ගොඩනැගිලි හා ඉඩම් ප්‍රත්‍යාගණනය කිරීම සඳහා රජයේ තක්සේරු දෙපාර්තමේන්තුවෙන් අදාළ එකඟතාවය හා අයකරනු ලබන ගාස්තු සම්බන්ධයෙන් ලැබී ඇති අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත ඉදිරි කටයුතු සිදුකරනු ලැබේ. | ප්‍රමිතිය ප්‍රකාරව සම්පූර්ණයෙන් ක්ෂය වී ඇති දේපළ පිරියත හා උපකරණවල ඵලදායී ජීවිත කාලය නැවත තක්සේරු කිරීමටත් ඉඩම් ප්‍රත්‍යාගණනය කිරීමටත් කටයුතු කළ යුතුය. |
| (ආ) | උපචිත සංකල්පය හා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 18 හි 09 වන ඡේදයට අනුව ලැබුණා හෝ ලැබිය යුතු සාධාරණ අගය සලකා බැලීමෙන් ආදායම් මැනීම කළ යුතුය. එසේ වුවද, 2022 අප්‍රේල් 22 දින පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා නිර්දේශය හා අධ්‍යක්ෂ මණ්ඩල තීරණ අනුව හල්මිල්ලෑව තේක්ක වැඩ බිමෙහි සිදුවී තිබූ රු.2,994,536 ක අලාභය | තවදුරටත් අයවිය යුතු මුදල ගෙවීම සම්බන්ධයෙන් පවතින අවිනිශ්චිතතාවය මත 2022 වර්ෂයේ ගිණුම්වලට ගැලපීම් සිදුනොකරන ලදී. මේ දක්වා ගෙවා ඇති මුදල 2023 වර්ෂය තුළ ගිණුම්වලට ගැලපීම් කිරීමට කටයුතු කර ඇති බව දන්වමි. | අය කරගත යුතු ගාස්තුවක් වන බැවින් ලැබිය යුතු ආදායමක් ලෙස ගිණුම් ගත කර අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ප්‍රමාදයකින් තොරව අයකර ගැනීමට ලබා දී තිබුණු නියෝගය අනුව එක් අයකුගෙන් පමණක් අයකරගත් රු.299,453 ක් හැර ඉතිරි රු.2,695,083 ක වටිනාකම සමාලෝචිත වර්ෂයේ ලැබිය යුතු ආදායමක් ලෙස හඳුනා ගෙන නොතිබුණි. ඒ හේතුවෙන් එම වටිනාකමකින් සමාලෝචිත වර්ෂයේ ආදායම හා ජංගම වත්කම් ඌන ගණනය වී තිබුණි. | | |
| (ඇ) | සංස්ථාවට එරෙහිව පවරා ඇති වන්දි වටිනාකම රු.2,008,710 ක් වූ නඩු 03 ක් සහ වන්දි වටිනාකම හඳුනා නොගත් නඩු 04 ක් සංස්ථාව විසින් පවරා ඇති නඩු වශයෙන් නිවැරදි නොවන ආකාරයට මූල්‍ය ප්‍රකාශනවලින් හෙළිදරව් කර තිබුණු අතර ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 37 හි 28 සහ 34 ඡේදයන් ප්‍රකාරව අසම්භාව්‍ය වගකීම් හා අසම්භාව්‍ය වත්කම් හඳුනා ගැනීමට ද කටයුතු කර නොතිබුණි. | මෙය ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරනු ලබන බව දන්වා සිටිමි. | පවතින නඩු නිවැරදි ආකාරයට හෙළිදරව් කර අසම්භාව්‍ය වගකීම් හා අසම්භාව්‍ය වත්කම් හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කළ යුතුය. |
| (ඈ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 02 හි 09 ඡේදය ප්‍රකාරව අවසන් තොගය පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගය යන අගයන්හි අඩු අගයට අගයකළ යුතු වුවත්, ප්‍රාදේශීය කාර්යාල 02 ක වෙන්දේසි කිරීම සඳහා වෙන් කර තිබුණු ශුද්ධ උපලබ්ධි අගය රු.11,244,320 ක් වූ දැව කඳන් සහ ඉරු දැව, ඒවායේ රු.12,951,479 ක් වූ පිරිවැය වටිනාකමට අගය කර තිබීමෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ලාභය හා තොග වටිනාකම රු.1,707,159 ක් බැගින් වැඩියෙන් දක්වා තිබුණි. | යාපනය ප්‍රාදේශිකයේ තොගවල පිරිවැය රු.8,161,246 ක් හා ශුද්ධ උපලබ්ධි අගය රු.6,730,021 ක් ද, බූස්ස ප්‍රාදේශිකයේ තොගවල පිරිවැය රු.4,790,233 ක් ශුද්ධ උපලබ්ධි අගය රු.4,514,299 ක් ද වේ. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 02 අනුව අවසන් තොගය පිරිවැය හෝ ශුද්ධලබ්ධි අගය යන දෙකෙන් අඩු අගයට ගිණුම් තැබිය යුතුය. |
| (ඉ) | ප්‍රාදේශීය කාර්යාල 09 ක පිරිවැය රු.303,526,109 ක් වූ තොගයේ ශුද්ධ උපලබ්ධි අගය රු.259,462,014 ක් වීමෙන් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 02 හි 34 ඡේදය ප්‍රකාරව අඩු වූ රු.44,064,096 ක අගය වියදම් යටතේත්, රු.303,526,109 ක පිරිවැය විකුණුම් පිරිවැය යටතේත් දැක්විය යුතු වුවද, ශුද්ධ අගය වූ රු.259,462,014 ක් විකුණුම් පිරිවැයට ගලපා තිබීමෙන් රු.44,064,096 ක් බැගින් දළ ලාභය හා වෙනත් වියදම් අඩුවෙන් නිරූපණය කර තිබුණි. | දළ ලාභයට ඇතිවන බලපෑම ඉදිරි ගිණුම් කටයුතුවල දී නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි. | ශුද්ධ උපලබ්ධි අගය පිරිවැයට වඩා අඩු වන විට ප්‍රමිතයේ සඳහන් ආකාරයට ගිණුම් ගැළපිය යුතුය. |

### 1.5.3 ගිණුම්කරණ ප්‍රතිපත්ති

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සංස්ථාවේ තොග ආගණනය කිරීමේ ප්‍රතිපත්තිය පළමු ලැබීමේ පළමු නිකුත් කිරීම (FIFO) ක්‍රමය වුවද, ඉරු දැව ගබඩාවල ඉතා පැරණි දැව පැවතුණි. එසේ පවතින පැරණි දැව කාල විශ්ලේෂණයක් කර ඊට අදාළ වන රේටයන් අනුව තොග වටිනාකම ආගණනය කළ යුතු වුව ද, ඇතැම් දැව තොග 2022 වර්ෂයේ ඉරු දැවවලට අදාළව ගණනය කළ රේටයන් යටතේ ගණනය කර තිබීමෙන් සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය ප්‍රකාශනවල පවතින ඉරු දැව තොගය නිවැරදි බවට සනාථ කළ නොහැකි විය. | පිළිතුර අදාළ නොවේ. | සංස්ථාවේ තොග අගය කිරීමේ ප්‍රතිපත්තිය පළමු ලැබීමේ පළමු නිකුත් කිරීම (FIFO) ක්‍රමය වන බැවින් පවතින තොග කාල විශ්ලේෂණයක් අනුව වර්ගීකරණය කර ඊට අනුකූල රේටයන් අනුව තොග ආගණනය කර නිවැරදි වටිනාකමට ගිණුම් ගත කළ යුතු අතර FIFO ක්‍රමය අනුව තොග නිකුත් කිරීම කළ යුතුය. |

### 1.5.4 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2022 ජුලි 31 දිනට සිදු කරන ලද විශේෂ තොග සමීක්ෂණ වාර්තාව අනුව කල්දෙමුල්ල ගෘහභාණ්ඩ සංකීර්ණයේ පිරිවැය රු.2,622,900 ක් වූ ප්‍රතික්ෂේපිත සිල්පර, විදුලි කණු සහ වැට කණු ඒකක 757 ක් ඉතිරි තොග වශයෙන් ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | ප්‍රතික්ෂේපිත සිල්පර ඒවායේ තත්ත්වය අනුව A, B, C වශයෙන් ශ්‍රේණි කර, වෙන්දේසි තොග සකස් කර අලෙවි කිරීම සිදුකරයි. ගුණාත්මකභාවයෙන් තොර අලි වැටකණු සහ විදුලිකණු සඳහා සැපයුම්කරුවන්ට ගෙවීම් නොකරන අතර ඒවා දර වශයෙන් අලෙවි කරනු ලබයි. | රජයේ කැළෑවලින් නිෂ්පාදිත මෙම සිල්පර, විදුලි කණු සහ වැට කණු වෙනුවෙන් ගුණාත්මක බවින් යුත් නිෂ්පාදිතයන් වෙනුවෙන් දරන ලද පිරිවැයම දරන බැවින් අවසන් තොගයට ඇතුළත් කිරීමෙන් පසුව ගිණුම්වලින් ඉවත් කිරීමට අවශ්‍ය පියවර ගත යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂය අවසානයට කැප්පෙටිපොල ගබඩාවට අයත් ඉරු දැව වෙන්දේසි තොග ආගණනය කිරීමේදී 2022 වර්ෂයට අදාළ ලොට් 73 ක පවතින ඝන ඩෙසිමීටර් 40,068 ක තොග, 2021 වර්ෂයේ ඒකක රේටය අනුව ආගණනය කිරීම නිසා අවසන් තොගය රු.1,501,748 ක් | කැප්පෙටිපොළ ගබඩාවේ ඉරු දැව වෙන්දේසි ලොට් 73 ක් 2022 වර්ෂයේ සකස් කළ ද එම තොගයේ ඇතුළත් බහුතරයක් දැව 2021 වර්ෂයට අදාළ ඉරු දැව වේ. 2021 වර්ෂයට අදාළ වෙන්දේසි ලොට් 02 ක් වැරදීමකින් 2022 වර්ෂයේ රේටයක් මත රු.47,787 ක් වැඩියෙන් ආගණනය වී ඇත. | සියලුම දැවවල කාලය නිවැරදිව හඳුනාගෙන අදාළ වර්ෂයේ රේටයන් භාවිතා කිරීමෙන් තොග ආගණනය කර නිවැරදි වටිනාකමට ගිණුම් ගත කිරීම සිදු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | අඩුවෙන් ද, 2021 වර්ෂයට අදාළ ඝන ඩෙසිමීටර් 1,275 ක ලොට් 02 ක් 2022 වර්ෂයේ ඒකක රේටයට අනුව ආගණනය කිරීම නිසා අවසන් තොගයේ වටිනාකම රු.47,787 කින් වැඩියෙන් ද, දැක්වීමෙන් කැප්පෙටිපොළ ගබඩාවේ සමස්ථ වෙන්දේසි තොගය රු.1,453,961 ක් අඩුවෙන් දැක්වුණි. | | |
| (ඇ) | අම්පාර ගෘහ භාණ්ඩ නිෂ්පාදනාගාරයේ 2009 වර්ෂයේ සිට පවතින වන අපරාධ කඳන් ඝන ඩෙසිමීටර් 148,178 ක් සම්බන්ධයෙන් පවත්නා නඩු කටයුතු අවසන් වී ඇත්දැයි සොයා බලා ඒවා තොග පොත්වලට ඇතුළත් කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | මෙම වන අපරාධ දැව සම්බන්ධයෙන් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (මෙහෙයුම්) විසින් නිකුත් කර ඇති චක්‍රලේඛන උපදෙස් අනුව කටයුතු කර නඩු කටයුතු අවසන් වී ඇත්නම්, කඩිනමින් අලෙවි කිරීමට කටයුතු කරන ලෙස උපදෙස් ලබාදී ඇත. | වන අපරාධ සම්බන්ධ නඩු කටයුතු අවසන් වී ඇත්දැයි සොයා බලා ඊට අදාළ දැව කඳන් තොග පොත්වලට ඇතුළත් කිරීමට කටයුතු කළ යුතුය. |

**1.5.5 අධිකාරී බලය නොලත් ගනුදෙනු**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| අධිකාරී බලය නොලත් ගනුදෙනු පිළිබඳ විස්තරය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අනුමත ජ'නල් සටහන් වවුචරයකින් තොරව සේවක ණය පොලී ලෙස රු.11,072,773 ක් රඳවාගත් ඉපැයුම්වලින් සේවක ණය චක්‍රිය අරමුදලට මාරු කර තිබුණි. | 2023 වර්ෂයේ දී නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි. | අනුමත ජ'නල් සටහන් මඟින් අදාළ මාරු සටහන් යෙදීමට කටයුතු කළ යුතුය. |

**1.5.6 අනුචිත ඇගයීම හෝ ඇස්තමේන්තු කිරීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ඇස්තමේන්තුව අනුව මුලතිව් මුරිප්පු වැඩ බිමෙහි මුළු දැව එලදාව ස.මී.1,550 ක් වුවද, සංස්ථාව එය ස.මී.700 ක් ලෙස ස.මී.850 ක් හෙවත් සියයට 54.84 ක් අඩුවෙන් ඇස්තමේන්තු කර තිබුණි. තවද, එම වැඩබිමෙහි C කොටසේ තත්‍ය එලදාව වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ඇස්තමේන්තුව සමඟ සැසඳීමේදී | ගස්වල පවතින භෞතික තත්ත්වයන්ට ගැලපෙන ආකාරයට 700 $m^3$ ක අස්වැන්න ඇස්තමේන්තු කර ඇත. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව වැඩබිම පවරනු ලබන අවස්ථාවේ දී ගස්වල පපුවට මට්ටමේ වටය ද, වැඩබිම් අවසන්වීමෙන් පසු ස්කන්ධභාග ගණනය කරනු ලබන අවස්ථාවේ දී නියැදිවල මිමි ලබාගෙන සමස්ථ වනවගාවටම ආදේශ කිරීම මඟින් පරිමා | වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් පරිමා ඇස්තමේන්තුව අදාළ සහකාර ප්‍රාදේශීය කළමනාකාර කාර්යාලයට වැඩබිම ආරම්භ කිරීමට පෙර ලබා දී ඇති බැවින් ඒ පිළිබඳව මනා සැලකිල්ලෙන් හා නිසි අධීක්ෂණයෙන් යුතුව කටයුතු කර නිවැරදිව ඇස්තමේන්තු සැකසිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| | දික් මීටර 13,662 ක් හෙවත් සියයට 64 ක අසාමාන්‍ය අඩුවක් නිරීක්ෂණය විය. | ඇස්තමේන්තුව ද ලබාදෙනු ලබයි. මෙම වැඩබිමේ ආයතන දෙක අතර පරිමාවේ පවතින විශාල විචලනය නිවැරදි කර ගැනීම සඳහා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව වෙත දැනුම්දී ඇත. | |
| (ආ) | පූර්ණ හෙළීම් වැඩ බිමක භූමි වර්ගීකරණය කිරීම සඳහා සංස්ථාව විසින් පොදු නිර්ණායකයන් 15 ක් ඇතුළත් සෑම වැඩ බිමකටම එක ලෙස ආදේශ කිරීමට නොහැකි අතාත්වික ක්‍රමවේදයක් අනුගමනය කර තිබුණු අතර මුලතිව් මුරිප්පු තේක්ක පූර්ණ හෙළීම් වැඩබිමට ද එය ආදේශ කිරීම තුළින් වැරදි භූමි වර්ගීකරණයක් සිදු කර තිබුණි. ඒ හේතුවෙන් දැව පරිවර්තනය කිරීම සඳහා කොන්ත්‍රාත්කරුවන්ට ඉහළ රේටයක් ගෙවීමට සිදුවී තිබුණු අතර නිලධාරීන් නිසි සැළකිල්ලෙන් යුතුව රාජකාරි ඉටු නොකිරීම මත පිරිවැය ඉහළ යැමෙන් සංස්ථාවට අලාභ සිදුවන බවට නිරීක්ෂණය විය. | පොදු නිර්ණායක 15 තුළ ඕනෑම පූර්ණ හෙළීම් වැඩබිමකට අදාළව නිවැරදිව වර්ගීකරණයක් සිදුකිරිමට හැකියාව ඇත. ඇතැම් අයිතම සාමාන්‍ය වැඩබිමක වර්ගීකරණයක් වන අතර, වෙනත් ඇතැම් අයිතම දුෂ්කර/ අතිදුෂ්කර ලෙස තිබිය හැකිය. නමුත් සම්ප්‍රයුක්තය සැලකූවිට මෙම වැඩබිම සඳහා ලැබී ඇති ලකුණු අනුව සැලකීමේදී එය අතිදුෂ්කර සීමාව ඉක්මවා ගිය ගණයට ඇතුළත්ව ඇත. | හඳුන්වා දී ඇති නිර්ණායක ආදේශ කිරීමේ ක්‍රමය තුළින් පූර්ණ හෙළීම් වැඩබිමකට සාධාරණ වර්ගීකරණයක් ලැබෙන බවට තහවුරු කරගත නොහැකි බැවින් පවතින ක්‍රමවේදය සංශෝධනය කිරීමට කටයුතු කළ යුතුය. |

**1.5.7 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විෂය | මුදල රු. | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ) | වාහන අලුත්වැඩියා වියදම් | 63,777,998 | වාහන විස්තර, අනුයුක්ත කාර්යාලය, අලුත්වැඩියාවට හේතුව, ස්වභාවය, වියදම හා සිදු කළ ආයතනය. | මෙම තොරතුරු ප්‍රාදේශිකවලින් ලබාගෙන කඩිනමින් ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ඇත. | විගණනය සඳහා අවශ්‍ය තොරතුරු ලබා දීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 2018 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා සිල්පර නිෂ්පාදනය සහ අළෙවිය | 32,346,175 | නිෂ්පාදිත ප්‍රමාණය, ඇනවුම් කළ ප්‍රමාණය, සම්පූර්ණ කළ ප්‍රමාණය හා ලැබිය යුතු මුදල. | මෙම තොරතුරු ප්‍රාදේශිකවලින් ලබාගෙන කඩිනමින් ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ඇත. | විගණනය සඳහා අවශ්‍ය තොරතුරු ලබා දීමට කටයුතු කළ යුතුය. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ණය පදනම මත ලබාදුන් දැව සහ දැව ආශ්‍රිත ගෘහභාණ්ඩ සඳහා 2022 දෙසැම්බර් 31 දිනට අය විය යුතු මුදල රු.මිලියන 908.87 ක් වූ අතර එයින් වසර 01 ත් 03 ත් අතර හිඟ හිටි ණය රු.මිලියන 430.86 ක් ද, වර්ෂ 04 ක් හා ඊට වැඩි ණය රු. මිලියන 59.85 ක් ද විය. ණය මුදල් ගෙවා නොමැති ආයතන 24 ක් වෙත නැවත නැවතත් ණයට භාණ්ඩ විකිණීම හේතුවෙන් එම ආයතනවලින් අයවිය යුතු ණය මුදල රු.770,799,748 ක් වූ අතර රාජ්‍ය ආයතන සමඟ ගිවිසුම් ගත නොවීම හා සියයට 10 ක ප්‍රමාද ගාස්තු අය නොකිරීම, විධිමත් ලේඛන පවත්වා මාසික අලෙවිය හා අයකර ගැනීමේ ප්‍රගතිය වාර්තා නොකිරීම, පරිගණක දත්ත පද්ධතිය යාවත්කාලින කර පවත්වා නොතිබීම යනාදිය ණය අය නොවීම කෙරෙහි බලපා ඇති බවට නිරීක්ෂණය විය. | අපගේ ප්‍රධාන ගැණුම්කරුවන් වන ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවෙන් සිල්පර සඳහා රුපියල් මිලියන 603 ක් සහ විදුලි බල මණ්ඩලයෙන් මිලියන 55 ක් වශයෙන් අයවීමට ඇති මුදල් කොටස් වශයෙන් අයකර නැවත භාණ්ඩ ලබාගැනීම සිදු කරන අතර රාජ්‍ය ආයතන 06 ක් කෘෂිකර්ම මේ වන විට කොටස් වශයෙන් ගෙවීම් කරනු ලබයි. | ණයට විකුණුම් හා මුදල් අයකර ගැනීමේ කටයුතුවලට අදාළ අභ්‍යන්තර පාලන පිළිවෙත් යාවත්කාලීන කිරීමට කටයුතු කළ යුතුය. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය. | | | |
| i. මුදල් රෙගුලාසි 110 | සංස්ථාවේ හානි පාඩු පිළිබඳ ලේඛනය යාවත්කාලින කර පවත්වා නොතිබුණි. | මේ වන විට හානි පූර්ණ ලේඛනය යාවත්කාලීන කරමින් යන බව දන්වා සිටිමි. | හානි පාඩු පිළිබඳ ලේඛනය යාවත්කාලින කර පවත්වා ගත යුතුය. |
| ii. මුදල් රෙගුලාසි 1646 | වාහන 39 කට අදාළව 2021 හා 2022 වර්ෂයන්හි දෛනික ධාවන සටහන් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | අවශ්‍ය ඕනෑම අවස්ථාවක එම ධාවන සටහන්පත් ගොනුව ඉදිරිපත් කිරීමට හැකියාව ඇත. | රෙගුලාසි ප්‍රකාරව දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ ඊළඟ මාසයේ 15 දිනට පෙර විගණන කටයුතු සඳහා ඉදිරිපත් කළ |

| | | | | |
|---|---|---|---|---|
| | | | | යුතුය. |
| (ආ) | 2021 නොවැම්බර් 16 දිනැති අංක 1/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.6 ඡේදය | ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත මුල්‍ය ප්‍රකාශන සමඟ විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු කෙටුම්පත් වාර්ෂික වාර්තාව 2023 ජුලි 10 දින වන විටත් ඉදිරිපත් කර නොතිබුණි. | 2022 වර්ෂයේ කෙටුම්පත් වාර්ෂික වාර්තාව කඩිනමින් ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කෙටුම්පත් වාර්ෂික වාර්තාව මුල්‍ය ප්‍රකාශන සමඟ දින 60 ක් ඇතුළත ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | 1992 අගෝස්තු 19 දිනැති අංක 26/92 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | සංස්ථා වාහනවල රාජ්‍ය ලාංඡනය යොදා නොතිබුණි. | රාජ්‍ය ලාංඡනය යෙදීම ඉදිරියේදී සිදුකිරීමට කටයුතු යොදන බව දන්වමි. | චක්‍රලේඛය ප්‍රකාරව රජයේ වාහනවල රාජ්‍ය ලාංඡනය යෙදීම අනිවාර්ය කර ඇති බැවින් ඒ අනුව කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2015 මැයි 25 දිනැති අංක PED 1/2015 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | | | |
| i. | 3.1, 3.2.1 සහ 3.2.2 ඡේද | නිලවාහන හිමි නිලධාරීන්ට මාසික ඉන්ධන ප්‍රමාණය, දීමනාවක් ලෙස ලබා දිය යුතු වුවද, මාසිකව ප්‍රතිපූරණය කිරීමේ පදනම මත අග්‍රිමයක් ලෙස ලබාදී එය ප්‍රමාණවත් නොවන අවස්ථාවලදී අත්තිකාරම් ලබා දීම මගිනුත් සිදු කර තිබුණි. ඊට අදාළ බොහෝමයක් ගමන් පෞද්ගලික ඒවා බවට නිරීක්ෂණය විය. | මෙහි සඳහන් කරුණු ඉදිරියේදී නිවැරදි කිරීම සඳහා ක්‍රමවේදයක් සකස් කරමින් පවතින බව දන්වා සිටිමි. | අදාළ නිලධාරීන්ට හිමි මාසික ඉන්ධන ප්‍රමාණය දීමනාවක් ලෙස ලබා දිය යුතු අතර නියමිත දීමනාව ඉක්මවා ඇත්නම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| ii. | 3.1 ඡේදය | සංස්ථා සභාපතිවරයාට මසකට භාවිතා කළ හැකි උපරිම ඉන්ධන ප්‍රමාණය ලීටර 170 ක් වුවද, 2020 හා 2021 වර්ෂයන්හි හිටපු | ඉන්පසු පැමිණි සභාපතිවරුන් සම්බන්ධයෙන් මෙවැනි තත්ත්වයක් උද්ගත වී නොමැති | හිටපු සභාපතිවරයා වෙතින් සංස්ථාවට සිදුව ඇති අලාභය අය කර ගැනීමට |

| | | | | |
|---|---|---|---|---|
| | | සභාපතිවරයා විසින් වාහන 03ක් භාවිතයට ගෙන මසකට හිමි ඉන්ධන ලීටර් 170 ට වඩා ලීටර් 705 ක් වැඩියෙන් ලබාගෙන තිබුණි. | බැවින්, මෙම කරුණ මේ වන විට නිවැරදි වී ඇත. | කටයුතු කළ යුතුය. |
| (ඉ) | 1982 පෙබරවාරි 05 දිනැති අංක 178/10 දරන අති විශේෂ ගැසට් නිවේදනය. | සංස්ථාවේ අරමුණක් වූ දැව ආශ්‍රිත නිමි හා අර්ධ නිමි භාණ්ඩ අපනයනය කිරීමේ කාර්යය ඉටු කර ගැනීම සඳහා ප්‍රමාණවත් පද්ධති හා පාලන ක්‍රමයක් ස්ථාපිත කිරීමට අපොහොසත් වී තිබුණි. | ඉදිරිපත් කර ඇති පිළිතුර නිරීක්ෂණයට අදාළ නොවේ. | සංස්ථාව පිහිටුවා ඇති අරමුණු කරා ළඟාවීමට අවශ්‍ය උපාය මාර්ගික සැලසුම් සකස් කර ප්‍රමාණවත් පද්ධති හා පාලන ක්‍රමයක් ස්ථාපිත කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.315,881,323 ක ලාභයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ලාභය රු.1,136,211,699 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.820,330,376 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට විකුණුම් ආදායම රු.952,613,427 කින් අඩුවීම හා වර්ෂයේ වියදම් රු.438,712,744 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

සමාලෝචිත වර්ෂයේ විකුණුම් ආදායම සියයට 16 කින් අඩු වී තිබිය දී විකිණීමේ හා බෙදාහැරීමේ වියදම් සියයට 46 කින් ද, පරිපාලන වියදම් සියයට 14.9 කින් ද, මූල්‍ය වියදම් සියයට 6.7 කින් ද වශයෙන් මුළු වියදම සියයට 28 කින් වැඩි වී තිබුණි. මේ හේතුවෙන් පෙර වර්ෂයේ සියයට 19.9 ක් වූ ශුද්ධ ලාභ අනුපාතය සමාලෝචිත වර්ෂයේ දී සියයට 6.6 ක් දක්වා එනම් සියයට 66 කින් අඩු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 අනාර්ථික ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අලි ගහනය බහුල ප්‍රදේශයක පිහිටා ඇති ඔඩ්ඩුසුඩ්ඩාන් ගබඩාව ආවරණය වන පරිදි 2018 වර්ෂයේ රු.993,751 ක වියදමකින් ඉදිකරන ලද නමුත් ආරම්භයේ සිටම ක්‍රියාත්මක නොවන විදුලි වැට අදාළ කොන්ත්‍රාත්කරු ලවාම අලුත්වැඩියා කරවා ගැනීමට හෝ කොන්ත්‍රාත්කරුට එරෙහිව ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු නොකිරීම හේතුවෙන් වැය කළ මුදල නිෂ්කාර්ය වී තිබුණු අතර ගබඩාවට හා නිලධාරීන්ට අලින්ගෙන් හානි සිදුවීමේ අවධානමක් පැවතුණි. | අදාළ කොන්ත්‍රාත්කරු විසින් මෙම කටයුත්ත ඉටුකර නොමැති අතර වෙනත් කොන්ත්‍රාත්කරුවෙකු ලවා ඉටුකරවා ගැනීමටත්, රඳවාගෙන ඇති මුදල් නිදහස් නොකිරීමටත් උපදෙස් ලබාදී ඇත. | අලි වැට අළුත්වැඩියා කරවා ගෙන නඩත්තු කිරීමට කටයුතු කළ යුතුය. |

**3.2 හඳුනාගත් පාඩු**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | විදුලි බල මණ්ඩලය වෙත යුකැලිප්ටස් වර්ගයේ විදුලි කණු සැපයීම සඳහා ඇති කරගත් ගිවිසුමේ කොන්දේසි අනුව නියමිත දිනට විදුලි කණු සැපයීමට නොහැකිවීම හේතුවෙන් දිනකට සියයට 0.1 ක් බැගින් උපරිමය සියයට 10 කට යටත්ව ප්‍රමාද ගාස්තු ගෙවීමට සිදුවී තිබුණු අතර 2011 වර්ෂයේ සිට 2016 දක්වා කාලය තුළ සංස්ථාව එළෙස ගෙවූ ප්‍රමාද ගාස්තුව රු.8,402,314 ක් වූ අතර සේවක අකාර්යක්ෂමතාවය මත ඇතිවූ පාඩුවක් බවට නිරීක්ෂණය විය. | ඇණවුම් භාරගන්නා අවස්ථාවේ පැවති තොගවලින් හා ඉතිරි කොටස වාර්ෂික නිෂ්පාදනයන්ගෙන් සැපයීමේ අපේක්ෂාවෙන් පසුගිය වර්ෂවල ඇණවුම් භාරගෙන ඇත. වන වගාවලින් සහ පුද්ගලික සැපයුම්කරුවන්ගෙන් වැඩි දිග ප්‍රමාණවල ප්‍රමිතියට අනුකූල විදුලිකණු සපයාගැනීමේදී පවතින හිඟය ඇණවුම් සම්පූර්ණ කිරීම ප්‍රමාදවීමට බලපෑ නමුත් 2017 වර්ෂයේ සිට ප්‍රමාද ගාස්තුවලින් තොරව විදුලිකණු සැපයීම සිදුකරමින් පවතී. | ගිවිසුම්ගත ආකාරයට විදුලි කණු සැපයීමටත්, නිලධාරීන්ගේ කාර්යක්ෂමතාව ඉහළ නැංවීමට අවශ්‍ය ක්‍රමවේද හඳුන්වා දීමටත් කටයුතු කළ යුතුය. |
| (ආ) | බුස්ස ගෘහ භාණ්ඩ නිෂ්පාදනාගාරයට අවශ්‍ය දැව ඉරීම වෙහෙරාන් යන්ත්‍රය සහ මැක්වුඩ් යන්ත්‍රය මඟින් සිදු කරන අතර එහි දී සියයට 47.3 ක සිට සියයට 64.2 ක් දක්වා ඉහළ අගයකින් දැව අපතයන් සිදුවන බව නිරීක්ෂණය විය. 2019 සිට 2022 වර්ෂය දක්වා සිදුවී ඇති දැව අපතය ඝන ඩෙසිමීටර් 857,940 ක් විය**.** | කඳන්වල තත්ත්වය සහ වර්ගය මත දැව ඉරනු ලබන යන්ත්‍රය තෝරා ගනු ලබයි. කළුවර, කුඹුක්, පළු හා මී වැනි තද දැව ඉහළ තාක්ෂණයෙන් යුතු woodmac හෝ වෙනත් යන්ත්‍ර මඟින් ඉරන විට අපතේ යන ප්‍රමාණය අඩු වුවත්, පරිවර්ථනය ඉතා අපහසු නිසා භාවිතා කළ හැකි හොඳම වෙහෙරාන් යන්ත්‍රයයි. නමුත් තේක්ක, කොස්, නඳුන් වැනි දැව වෙහෙරාන් යන්ත්‍රය මඟින් පරිවර්තනය කරන විට විශාල කාලයක් ගතවීම හා දැව අපතය ඉහළ වීම නිසා එමඟින් සිදු නොකරයි. කළුවර කඳන් පැලීම් පිපිරීම් වැනි විශාල දෝෂයන්ට ලක්වීම නිසා ලබාගත හැකි අස්වැන්න සාමාන්‍යයෙන් සියයට 33 ක් වන හෙයින් අපතේ යන ප්‍රමාණය සියයට 66 ක් වැනි අගයක තබා මිළ සකස් කර ඇත. | දැව පරිවර්ථනය කිරීමේදී දැව අපතය අවම වන යන්ත්‍ර සහ ක්‍රමවේද භාවිතා කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | ගොමදියගාල 01/22 තේක්ක වැඩබිමෙහි 2017 වර්ෂයේදී සිදු වී තිබුණු අක්‍රමිකතාවක් සම්බන්ධ චෝදනාවට ලක් වූ සේවකයන් සම්බන්ධයෙන් විනය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු නොකිරීම නිසා එම නිලධාරීන්ට උසස්වීම් ලබා දීමට ද කළමනාකාරිත්වය කටයුතු කර තිබුණි. | මෙ සම්බන්ධව විධිමත් විනය පරීක්ෂණයක් සිදු නොකර නිදහස් කර ඇති බැවින්, විනය පරීක්ෂණයක් සිදුකරන ලෙස අධ්‍යක්ෂ මණ්ඩලය දැනුම් දී ඇත. | අක්‍රමිකතා සිදු කිරීම වැලැක් වීම සඳහා ශක්තිමත් අභ්‍යන්තර පාලන පද්ධතියක් ස්ථාපිත කිරීමටත්, චෝදනාවට ලක් වූ සේවකයන් සම්බන්ධයෙන් |

| | | | |
|---|---|---|---|
| | | | විධිමත් විනය ක්‍රියාමාර්ග ගැනීමටත්, උසස්වීම් ලබා දීම විධිමත් කිරීමටත් කටයුතු කළ යුතුය. |
| (ඇ) | බුස්ස හා අම්පාර නිෂ්පාදනාගාරයන්හි එක්රැස් වන තොග අඩු කිරීම සඳහා දැව අට්ටි ගසා ප්‍රසිද්ධ වෙන්දේසියේ අඩු මිලකට අලෙවි කිරීමට පියවර ගෙන තිබුණි. ඒ ආකාරයට 2020 වර්ෂයේ දී රු.1,902,698 ක් වටිනා තොග අට්ටි 49 ක් රු.943,300 කට අලෙවි කිරීමෙන් සංස්ථාවට රු.959,398 ක පාඩුවක් සිදුවී තිබුණු අතර වෙන්දේසි නොවී පවතින පිරිවැය රු.49,823,171 ක් වූ ලොට් 191 ක වෙන්දේසි වටිනාකම රු.21,744,180 ක් වීමෙන් අවම වශයෙන් රු.28,078,991 ක පාඩුවක් සිදුවීමට ඉඩකඩ පවතින බවට ද නිරීක්ෂණය විය. | ජනප්‍රිය නොවන ඉල්ලුමක් නොමැති අතුරු නිෂ්පාදන අලෙවි කිරීම මිළ ලේඛනයේ ඇති ස්ථාවර මිළ ගණන් මත නොව ඊට අඩු මිළක් යටතේ දැවවල පවතින තත්වය මත පදනම්ව අට්ටි සකස් කර වෙන්දේසි මඟින් ප්‍රසිද්ධ කර පහළ ශ්‍රේණි මිළක් යටතේ අලෙවි කිරීම සිදුවේ. | ජනප්‍රිය නොවන මිම්වලට අදාළ දැව මෙන්ම ජනප්‍රිය මිම්වලට අදාළ දැව ද මෙම තොග තුළ පවතින බැවින් අතිරික්ත දැව ඵලදායී ලෙස නිසි මිල ගණන් යටතේ කාලීනව අළෙවි කිරීමට හෝ වෙන්දෙසි කිරීමට සුදුසු ක්‍රමවේදයක් සකස් කළ යුතුය. |

**3.3 කළමනාකරණ අකාර්යක්ෂමතා**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සංස්ථාවේ කුරුණෑගල ප්‍රාදේශීය කාර්යාලය හා දැව ගබඩාව පිහිටි හෙක්ටයාර් 0.5033 ක ඉඩම මිලදී ගැනීම සඳහා 1987 වර්ෂයේ දී ඇස්තමේන්තුගත රු.400,000 ක මුදලෙන් සියයට 15 ක් ප්‍රාදේශීය ලේකම් වෙත තැන්පත් කර එය නොසළකා හැරීමත්, ඉන් වසර 15 කට පසු 2002 වර්ෂයේ දී එහි අයිතිකරුට රු.12,000,000 ක් ගෙවා ඉඩම අත්පත් කර ගැනීමට ප්‍රාදේශීය ලේකම් කළ දැනුම්දීම නොසලකා හැරීමත් හේතුවෙන් 2019 වර්ෂයේ අභියාචනාධිකරණ නඩු තීන්දුවක් අනුව වන්දි හා නෛතික පොලී සමඟ රු.32,005,946 මුදලක් ප්‍රාදේශීය ලේකම් වෙත ගෙවීමට සිදුවී තිබුණි. තවද, ප්‍රාදේශීය ලේකම් විසින් ඉඩමේ අයිතිකාර සමාගම වෙත එයින් රු.24,414,578 ක් පමණක් ගෙවා රු.7,591,369 ක මුදලක් රඳවාගෙන තිබීමත් අදාළ ඉඩම සංස්ථාවට පවරා දීමට ද කටයුතු කර නොතිබීමත් මතභේදාත්මක කරුණක් විය. | 2019 අභියාචනාධිකරණ තීන්දුව අනුව රජය විසින් පල කරන ලද ගැසට් පත්‍රය ප්‍රකාරව නෛතික පොලිය සකස් කර රු.32,005,946 ක මුදලක් ගෙවීම් කර ඇති නමුත් ප්‍රාදේශීය ලේකම් විසින් ඉඩමේ අයිතිකරු වන මැල් සමාගම වෙත රු.24,414,578 ක මුදලක් පමණක් ගෙවා ඇති බැවින්, ඉතිරි මුදල් කඩිනමින් සංස්ථාව වෙත ගෙවන ලෙසට ප්‍රා.ලේ වෙත දන්වා ඇත. | කුරුණෑගල ප්‍රාදේශීය කාර්යාලය පිහිටි ඉඩමේ අයිතිය ලබා ගැනීමට කටයුතු කළ යුතු අතර, වැඩිපුර මුදලක් ප්‍රාදේශීය ලේකම් වෙත ගෙවා ඇත්නම් එම මුදල් අයකර ගැනීමට ද කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2020 ජනවාරි 09 දින සිට 2022 මාර්තු 10 දින දක්වා සංස්ථාවේ හිටපු සභාපතිවරයා විසින් භාවිතා කරන ලද Dell Laptop 01 ක්, Samsung Tab 01 ක් සහ Samsung Mobile Phone 01 ක් නැවත භාර නොදීම හේතුවෙන් ඔහුගෙන් අයකළ යුතු බවට ගණනය කළ රු.529,199 ක වෙළඳපොල වටිනාකම හා නැවත අත්පත් කර ගැනීමට දැරියයුතු වියදම සියයට 25 ක් ඇතුලුව මුළු මුදල රු.532,949 ක් අයකරගෙන නොතිබුණි. | මෙතෙක් මෙම භාණ්ඩ හෝ එහි වර්තමාන භාණ්ඩ වටිනාකම හා ඒවා සපයා ගැනීමට දැරිය යුතු වියදමින් සියයට 25 ක් සමඟ එකතුව රු.532,949 ක් සංස්ථාව වෙත ගෙවීම් කර නොමැති බව දන්වමි. | අදාළ වත්කම් අත්පත් කර ගැනීමට හෝ වෙළඳපළ වටිනාකම අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඇ) | නුවරඑළිය දිස්ත්‍රික්කයේ ගෘහ භාණ්ඩ ප්‍රදර්ශනාගාරයක් ස්ථාපිත කිරීමේ යෝජනාවකට අනුව නිලධාරින් දෙදෙනෙකුගෙන් සමන්විත කමිටුවක් මඟින් ශක්‍යතා අධ්‍යනයකින් තොරව රිකිල්ලගස්කඩ නගරය හා එහි ගොඩනැගිල්ලක් සුදුසු බවට කර තිබුණු නිර්දේශ පදනම් කරගෙන රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය නොකර රු.80,000 ක මාසික කුලී පදනමට 2021 මාර්තු සිට ලබාගත් ගොඩනැගිල්ලකට මාස 15ක් සඳහා රු.1,200,000 ක බදු කුලී ගෙවා එම කාලය තුළ රු.9,016,761 ක අලාභයක් ලබමින් පවත්වාගෙන ගොස් 2022 ජූනි 18 දින ප්‍රදර්ශනාගාරය වසා දමා තිබුණි. ප්‍රදර්ශනාගාරයේ ආදායම් හා වියදම් වාර්තා ඉදිරිපත් කර නොතිබීමෙන් මෙම ප්‍රදර්ශනාගාරය අලාභ ලබමින් පවත්වාගෙන යනු ලබන බව කල් ඇතිව හඳුනා ගැනීමට ද නොහැකි වී තිබුණි. | කමිටුව මඟින් ලබා දුන් නිර්දේශ හා ගරු අමාත්‍යතුමගේ උපදෙස් පරිදි අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත ප්‍රදර්ශනාගාරය ආරම්භ කර ඇත. අලාභ මට්ටමින් ප්‍රදර්ශණාගාරය පවත්වාගෙන යාම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත කරුණු ඉදිරිපත් කර 2022.06.18 දින එම ප්‍රදර්ශණාගාරය වසා දැමීමට කටයුතු කර ඇති බව දන්වමි. | නව ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට පෙර එහි යෝග්‍යතාව පිළිබඳව විධිමත් ශක්‍යතා අධ්‍යනයක් සිදු කර එහි ඵලදායිතාවය පරීක්ෂා කිරීමට කටයුතු කළ යුතු අතර ගිණුම් තැබීම් කාලීනව නිවැරදිව කළ යුතුය. |
| (ඈ) | වාර්ෂික විකුණුම් අවශ්‍යතාවය මත නිෂ්පාදන අවශ්‍යතාවය පුරෝකථනය කිරීම, යහපත් තොග පාලන ශිල්ප ක්‍රම අනුගමනය කර විධිමත් හා ප්‍රමාණවත් ගබඩා පවත්වා ගැනීම, කාර්යක්ෂම නිෂ්පාදන ක්‍රියාවලියක් ස්ථාපිත කිරීම යන කරුණු සම්බන්ධයෙන් ඉහළ කළමනාකාරිත්වයේ අවධානය යොමු නොවීම හේතුවෙන් 2012 වර්ෂයේ සිට 2022 ජුලි 31 දින දක්වා නිෂ්පාදනය කරන ලද පිරිවැය රු.68,239,793 ක් වූ අතිරික්ත ගෘහ භාණ්ඩ තොගයක් ද, 2022 වර්ෂය තුළ කිසිදු අළෙවියක් කර නොතිබුණු රු.7,152,896 ක් වටිනා ගෘහ භාණ්ඩ | ඉහළ ඉල්ලුමක් ඇති අලෙවි සැලැස්මට අදාළ ගෘහ භාණ්ඩ පමණක් නිෂ්පාදනය කිරීම වර්තමානයේ සිදුකරන නිසා ඉදිරියේදී මෙම තත්ත්වය ඇති නොවේ. මේ වන විට ඔප නොදමා තිබූ ගෘහ භාණ්ඩ ප්‍රමාණය අලෙවි අංශයෙන් ලැබෙන ඇණවුම් මත ඔපදමමින් ප්‍රදර්ශණාගාරය වෙත නිකුත් කිරීම සිදු කරමින් පවතී. | වාර්ෂික විකුණුම් අවශ්‍යතාවය මත නිෂ්පාදන පුරෝකථනයන් කිරීම, විධිමත් හා ප්‍රමාණවත් ගබඩා පවත්වා ගැනීම, කාර්යක්ෂම නිෂ්පාදන ක්‍රියාවලියක් ස්ථාපිත කිරීම යන කරුණු සම්බන්ධයෙන් ඉහළ |

| | | | |
|---|---|---|---|
| | අයිතම 32 ක් සහ ඉතා සෙමින් අලෙවි වන රු.3,132,000 ක් වටිනා ගෘහභාණ්ඩ අයිතම 12 ක් ද, 2012 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා නිෂ්පාදනය කරන ලද නමුත් ඔප නොදමන ලද වටිනාකම රු.20,474,207 ක් වූ ගෘහ භාණ්ඩ තොගයක් ද බූස්ස ප්‍රදර්ශනාගාර ගබඩාවේ හා යන්ත්‍රාගාරයේ පැවතුණි. | | කළමනාකාරීත්ව යේ අවධානය යොමු කළ යුතුය. |

**3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වන අපරාධ අංක හෝ වනයෙන් නිකුත් කිරීමේ නිවේදනපත් අංකයක් හෝ වෙනත් ලිඛිත සාක්ෂියක් නොමැති අලෙවි වටිනාකම රු.3,420,427 ක් වූ කැබලි 2,570 ක් ඇතුළත් වන අපරාධ ඉරූ දැව තොග (Lot) 35 ක් නිෂ්කාර්ය ලෙස කැප්පෙට්ටිපොළ ගබඩාවේ රඳවාගෙන තිබුණි. | අලෙවි අංශය දැනුවත් කර නොමැති වීමෙන් මෙම දැව අලෙවි කිරීමට අදාළ කටයුතු මෙතෙක් සිදුකර නොමැත. තොරතුරු කඩිනමින් ගෙන්වා ගෙන එම ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමටත්, එම ඉරූ දැව වාර්තා නොකිරීම සම්බන්ධයෙන් අදාළ නිළධාරීන්ගෙන් කරුණු විමසීමටත් කටයුතු කර ඇත. | සෑම ගබඩාවකම පවතින වන අපරාධ දැව සම්බන්ධයෙන් තොරතුරු කඩිනමින් ගෙන්වා ගෙන එම දැව අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් ලබා දී ඇති උපදෙස් පරිදි අපහරණය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | බොරලන්ද ගබඩාවේ 2019 වර්ෂයේ සිට අක්‍රීයව පවතින වෙහෙරාන් ඉරුම් යන්ත්‍රය අළුත්වැඩියා කිරීමට කටයුතු නොකිරීම හේතුවෙන් වට අඩි 04 ට වැඩි කඳන් ඉරීම අඩපන වී එම කාර්යය CHAIN SAW යන්ත්‍රය මඟින් සිදු කරමින් පැවතීම නිසා දැව ඉරීමේ අපතය ඉහළ අගයක් ගන්නා බවට නිරීක්ෂණය විය. | 2004 වසරේ ස්ථාපිත කරන ලද මෙම වෙහෙරාන් යන්ත්‍රය නිෂ්පාදනය කරන ලද සමාගම් මේ වන විට නව තාක්ෂණය සහිත වෙනත් ඉරුම් යන්ත්‍ර නිෂ්පාදනයට යොමු වී ඇති නිසා අලුත්වැඩියා කර ගැනීමට අපහසුවී ඇත. නමුත් දැව ඉරීමේදී සමස්ථ ඵලදායීතාවය සැලකිල්ලට ගෙන අඩි 4 ට වැඩි කඳන් දම්වැල් කියත් යොදවා වුඩ්මයිසර් යන්ත්‍රය මඟින් පරිවර්තනය කර ගැනීම සිදු කර ගන්නා අතර එය මෙවැනි අවස්ථාවක භාවිතා කළ හැකි පිළිගත හැකි ක්‍රමය වේ. | යන්ත්‍රවල ක්‍රියාකාරීත්වය පිළිබඳව නිරන්තරයෙන් පසුවපරම් කර අළුත්වැඩියා හා නඩත්තු කටයුතු කාලීනව නිසි පරිදි කිරීමටත්, වඩාත් ඵලදායි වෙනත් විකල්ප භාවිතා කිරීමටත් අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඇ) | මුලතිව් දිසා වන කාර්යාලය යටතේ පාලනය වන හෙක්ටයාර් 40 ක් වූ මුරිප්පු තේක්ක වගාව පූර්ණ හෙළීම් සඳහා 2021නොවැම්බර් මස රාජ්‍ය දැව සංස්ථාවට භාර දී තිබුණු අතර එහි වැඩ නිම කර 2022 අගෝස්තු 31 දින වන විට ආපසු වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට භාර දිය යුතුව තිබුණි. එසේ වුවද, හෙළීම් අවසන් නොකිරීම, කඳන් අංක නොකර රඳවාගෙන තිබිම, නිවැරදි දත්ත ඇතුළත්ව ලේඛන යාවත්කාලීන නොකිරීම හා අඩු | මුරිප්පු වැඩබිම්වල සිදු වී ඇති අක්‍රමිකතා හේතුකොටගෙන මේ වන විට සහකාර ප්‍රාදේශීය කළමනාකාර හා වැඩබිම් නිලධාරී වැඩ තහනමට ලක්කර ඇති අතර, විමර්ෂණ හා විගණන කටයුතු සිදුකරමින් පවතී. මේ වන විට වැඩබිම්වල වැඩ අවසන් වෙමින් පවතින අතර, විමර්ෂණයෙන් අනතුරුව ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන බව දන්වමි. | අක්‍රමිකතාවයට අදාළ විනය පරීක්ෂණ විධිමත්ව සිදු කර එහි ප්‍රගතිය පිළිබඳව වාර්තා ඉදිරිපත් කිරීමටත්, එවැනි අක්‍රමිකතා නැවත සිදු නොවීමට අවශ්‍ය අභ්‍යන්තර පාලන ක්‍රම සකස් කිරීමටත් කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | එලදාවක් ලේඛනගත කර තිබීම, නිවේදන පත්‍රවල අංක හා කඳන් අංක වෙනස් වීම, හෙලීම් කළ යුතු ගස් තැනින් තැන ඉතිරි කර තිබීම යනාදී විවිධ අක්‍රමිකතා හේතුවෙන් 2023 මැයි 16 දින වන විට වසර 02 කට ආසන්න කාලයක් ගතවී තිබුණ ද එහි වැඩ නිම කිරීමට සංස්ථාව අපොහොසත් වී තිබුණි. | | |
| (ඈ) | සංස්ථාව විසින් ගෘහ භාණ්ඩ නිෂ්පාදනය සඳහා ගත වන ශ්‍රම පැය ඇස්තමේන්තු කර තිබුණ ද, සත්‍ය වශයෙන් වැය වන ශ්‍රම පැය සමඟ සසඳා ශ්‍රමිකයන්ගේ කාර්යක්ෂමතාව හා ඵලදායීතාව මැනීමට ක්‍රමවේදයක් සකස් කර නොතිබීමෙන් ශ්‍රමිකයන් කාර්යක්ෂමව හා ඵලදායිව යොදාගෙන ඇති බවට සනාථ කළ නොහැකි විය. | නිෂ්පාදන පෙළක් (production line) සිදු කරගෙන යන අවස්ථාවේදී එක් එක් සේවකයා විසින් කරනු ලබන කාර්යයන් මැන සටහන් කිරීම සඳහා නිෂ්පාදනාගාර වෙත උපදෙස් ලබා දී ඇතත් සමහර අවස්ථාවල එය ක්‍රියාත්මක නොවන බව පෙනී යන නිසා පසුවිපරම් කිරීමට ක්‍රමවේදයක් සකස් කිරීම සඳහා කමිටුවක් පත් කර ඇත. | සේවක කාර්යක්ෂමතාව හා ඵලදායීතාව මැනීමට ක්‍රමවේදයක් සකස් කර ගෘහ භාණ්ඩ නිෂ්පාදනය සඳහා ගත වන සත්‍ය ශ්‍රම පැය මත ගෘහ භාණ්ඩ පිරිවැය ගණනය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | බූස්ස නිෂ්පාදනාගාර සංකීර්ණයේ ගෘහ භාණ්ඩ නිෂ්පාදනය කෙටි වැඩ ගිවිසුම් මත බාහිර කොන්ත්‍රාත්කරුවන් මඟින් ඉටුකරවා ගන්නා අතර ඒ වෙනුවෙන් 2013 වර්ෂයේ සිට 2022 මාර්තු දක්වා කාලසීමාව තුළ කොන්ත්‍රාත්කරුවන් 69 දෙනෙකුට රු.10,322,050 ක කොටස් මුදල් ගෙවා තිබුණි. එසේ වුවද, අදාළ කාර්යයන් ගිවිසුම් කාලය තුළ නිමකරවා ගැනීමට කළමණාකරණය අපොහොසත් වීම හේතුවෙන් ඇතැම් කාර්යයන් සඳහා නැවත මිල ගණන් කැඳවීමටත්, සංස්ථා සේවකයන් ලවා ඉටුකරවා ගැනීමටත් සිදුවී තිබීමෙන් අධික කාලයක් හා අමතර පිරිවැයක් දැරීමට සිදු වන බවට නිරීක්ෂණය විය. | බූස්ස ඒකකයේ පාරම්පරික ගෘහ භාණ්ඩ නිෂ්පාදනය භාහිර වඩු කාර්මිකයන් මඟින් කොන්ත්‍රාත් පදනමින් ගිවිසුම්ගතව සිදුකරනු ලබන වැඩ කොටස මත පදනම්ව යම් ප්‍රතිශතයක් ගෙවනු ලබයි. නියමිත ගිවිසුම් කාලය තුළ වැඩ අවසන් නොකළ කොටස් නිම කිරීමටත්, නැවත මිළගණන් කැඳවා අළුතින් කොන්ත්‍රාත්කරුවන් වෙත යොමු කිරීමටත්, සමහර අවස්ථාවල සංස්ථා සේවකයින් ලවා ඉතිරි කොටස් නිම කිරීමටත් යොමු වී ඇත. | කොන්ත්‍රාත්කරුවන් මඟින් ගෘහ භාණ්ඩ නිෂ්පාදනය කර ගැනීමේදී ගිවිසුම් කාළය තුළ අදාළ කාර්ය නිමකර ගැනීමට අවශ්‍ය පියවර ගත යුතුය. |
| (ඊ) | බූස්ස නිෂ්පාදනාගාරයෙහි හැකියාව සහිත සුදුසු කොන්ත්‍රාත්කරුවන්ට කොන්ත්‍රාත් භාර නොදීම හා නිෂ්පාදනාගාරයේ අවිධිමත් සැලසුම්කරණය හේතුවෙන් වසර 01 ත් වසර 10 කට වැඩි කාලයකත් සිට පවතින කෙරීගෙන යන වැඩවල වටිනාකම රු.21,689,756 ක් වූ අතර කාලීන අවශ්‍යතාවය හඳුනා නොගැනීම හා අලෙවි කටයුතු ප්‍රවර්ධනය නොකිරීම හේතුවෙන් 2022 ජුලි 31 දිනට භාවිතයෙන් තොරව පවතින දැව | දැනට අර්ධ වශයෙන් නිෂ්පාදනය කර ඇති ගෘහ භාණ්ඩ කඩිනමින් නිෂ්පාදනය කර අවසන් කිරීමට කටයුතු කරමින් පවතින බැවින්, ඉදිරියේදී මෙවැනි තත්වයත් ඇති නොවීමට නිෂ්පාදන කටයුතු සිදුකරනු ලබයි. | කෙරීගෙන යන වැඩ කඩිනමින් අවසන් කර අළෙවි කිරීමටත්, අවශ්‍යතාවය හඳුනාගෙන නිෂ්පාදන කටයුතු සැලසුම් කර හැකියාව සහිත සුදුසු කොන්ත්‍රාත්කරුවන්ට කොන්ත්‍රාත් භාර දීමටත්, අලෙවි කටයුතු ප්‍රවර්ධනය |

| | | | |
|---|---|---|---|
| | තොගයෙහි වටිනාකම රු.මිලියන 65.5 ක් විය. | | කර නිෂ්පාදන කාර්යක්ෂම කිරීමටත් කටයුතු කළ යුතුය. |
| (උ) | අම්පාර දැව ඉරුම්හලේ 2019 සිට 2022 වර්ෂය දක්වා කාලය තුළ පරිවර්තනය කිරීම සඳහා භාවිතයට ගෙන තිබුණු දැව ප්‍රමාණය ඝන ඩෙසිමීටර් 3,512,926 ක් වූ අතර නිමවුම ලෙස ලබා ගත් දැව ප්‍රමාණය ඝන ඩෙසිමීටර් 1,806,397 ක් වුයෙන් දැව පරිවර්තනය කිරීමේ දී සිදු වී ඇති අපතය ඝන ඩෙසිමීටර් 1,706,529 ක් හෙවත් සියයට 49 ක් විය. එම කාලය තුළ ඇතැම් කාර්යයන් සඳහා අවශ්‍යතාව ඉක්මවා සියයට 32 ක් වැඩියෙන් ඝන ඩෙසිමීටර් 454,496 ක දැව ප්‍රමාණයක් නිකුත් කර ඇති බවට ද, ඉරන ලද රු.295,712,614 ක් වටිනා ඝන ඩෙසිමීටර් 3,718,422 ක විශාල දැව තොගයක් කාර්යක්ෂමව භාවිතයට ගැනීමට සුදුසු වැඩපිළිවෙලක් නොතිබීමෙන් ගොඩගැසී ඇති බවට ද නිරීක්ෂණය විය. | තොප්පිගල වැඩබිම්වලින් ලැබුණු කඳන්වල උණ්ඩ කැබලි යකඩ කැබලි බහුලව දක්නට ලැබීමත්, කඳන්වල අඟල් 1.2 ක පමණ එළයක් පැවතීමත්, ඇණවුම් පිරිවිතර අනුව දෝෂ ඉවත් කර ගෘහ භාණ්ඩ නිෂ්පාදනය සිදු කිරීමත්, අක්‍රමවත් ලෙස පරිවර්තනය වී තිබූ සහ විවිධ දෝෂ ඉවත් කර හොඳ දැව ප්‍රමාණය වෙන් කර ගෘහ භාණ්ඩ නිෂ්පාදනයට යොමු කරන අවස්ථා පැවතීමත් අනුව අපතේ යාමේ ප්‍රතිශතය ඉහළ අගයක් ගනී. ඉදිරි ඇණවුම් බලාපොරොත්තුවෙන් දැව පරිවර්ථනය කර පදම් කර යම් තොගයක් පවත්වාගෙන යාම සිදුවේ. | දැව පරිවර්තනයේ දී උපරිම දැව ඵලදාවක් ලබා ගත හැකි ශිල්පීය ක්‍රම හා සුදුසු දැව භාවිතා කර දැව අපතය වලක්වා ගැනීමට සහ නිෂ්පාදන කාර්යක්ෂමතාව වැඩි කිරීමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඌ) | 2018 වර්ෂයට පෙර සිට වැද්දුම් වැඩ නිම කරන ලද නිමවුම් වටිනාකම රු.98,476,655 ක් වූ අර්ධ නිමි භාණ්ඩ ඒකක 6,133 ක් නිම කර මාරුකිරීමට කටයුතු නොකිරීම හේතුවෙන් අම්පාර නිෂ්පාදනාගාරයෙන් ඉදිරි නිෂ්පාදන ගබඩා කිරීමේ ගැටළුවකට මුහුණ දී තිබුණි. | සේවකයින්ගේ හිඟය හේතුවෙන් යාන්ත්‍රික හා වැද්දුම් කටයුතු සිදුකරන වේගයට සාපේක්ෂව ඔප දැමීමේ කටයුතු සිදු කිරීමට නොහැකි වීම මෙම තත්වයට හේතු වී ඇත. අම්පාර කර්මාන්ත ශාලාව ප්‍රතිව්‍යුහගත කිරීමේ සැලැස්මට අනුව අර්ධ නිමි භාණ්ඩ කල්දෙමුල්ල නිෂ්පාදනාගාරය වෙත ගෙන ගොස් වැද්දුම් කර ඔප දමා අලෙවි කිරීමේ ක්‍රමවේදයක් ස්ථාපනය කරමින් පවතී. | පවතින ගැටළු සඳහා නිසි විසඳුම් ලබාගෙන අර්ධ නිමි භාණ්ඩ නිම කර අලෙවි කිරීමට කටයුතු කළ යුතුය. |
| (එ) | Finger joint ගෘහ භාණ්ඩ නිෂ්පාදනය සංස්ථා සේවකයන් යොදවා සිදු කරනු ලැබුව ද, එම සේවකයන්ගේ කාර්යක්ෂමතාව සහ කාර්යසාධනය ඇගයීම සඳහා විධිමත් පාලන ක්‍රමවේදයක් ස්ථාපිත කර නොතිබීමෙන් සිදුවන අකාර්යක්ෂමතාවය මත ඇණවුම් නිසිකලට සම්පූර්ණ කිරීමට නොහැකි වී තිබුණු අතර බෝඩ් 1,050 ක ඇණවුමක් අවලංගු කර තිබුණි. තවද, Finger joints | මේ වන විට finger joint ඒකකයට ලබා දී ඇති ඇණවුම් සියල්ල අවසන් කර ඇත. අම්පාර නිෂ්පදනාගාරය වෙත board 1,050 නිෂ්පාදනය කිරීම අත්හිටුවා ඒ වෙනුවට ප්‍රදර්ශනාගාර හරහා අලෙවි කළ හැකි ගෘහ භාණ්ඩ නිෂ්පාදනයට එම දැව යොදවන ලදී. ලබාගනු ලබන ඇණවුම් මත | Finger joint ගෘහ භාණ්ඩ ඇණවුම් මත පමණක් නිෂ්පාදනය කිරීමට කටයුතු කිරීම මෙන්ම, දැනට තිබෙන නිෂ්පාදන කඩිනමින් නිම කර අලෙවි කිරීමට අවශ්‍ය පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | බෝඩ් ආධාරයෙන් නිම කරන ලද ගෘහ භාණ්ඩ අලෙවිය ද ඉතා අවම මට්ටමක පැවතුණි. | පමණක් Finger joint නිෂ්පාදනය කරනු ලබයි. | |
| (ඒ) | වන අපරාධ දැව සම්බන්ධයෙන් ගතයුතු ක්‍රියාමාර්ග පිළිබඳව 2018 ඔක්තෝබර් 10 දිනැති අංක 422 දරන අධිකරණ සේවා කොමිෂන් සභා චක්‍රලේඛය මඟින් ලබා දී ඇති උපදෙස් අනුගමනය නොකර අම්පාර නිෂ්පාදනාගාරයෙහි 2019 වර්ෂයට පෙර සිට පවතින රු.1,219,620 ක් වටිනා ඝන ඩෙසිමීටර් 16,088 ක වන අපරාධ ඉරූ දැව සහ රු.1,932,541 ක් වටිනා ඝන ඩෙසිමීටර් 158,274 ක වන අපරාධ දැව කඳන් තොගයක් ද පැවතුණි. | පැවති දැව තොගයෙන් කොටසක් උසාවි සමඟ සම්බන්ධ වී නිදහස් කරගෙන ඇති අතර, ඉතිරි ප්‍රමාණය නිදහස් කර ගැනීමට අවශ්‍ය කටයුතු ප්‍රාදේශීය කළමණාකාර විසින් සිදු කරගෙන යනු ලබයි. ඉන් පර්වර්තනය සඳහා සුදුසු දැව ප්‍රමාණය ඉතිරි කරගෙන ඉතිරි දැව අම්පාර ගබඩාවට අලෙවිය සඳහා යැවීමට කටයුතු කර ඇත. | වන අපරාධ දැව සම්බන්ධයෙන් කොමිෂන් සභා චක්‍රලේඛය මඟින් ලබා දී ඇති උපදෙස් අනුව කටයුතු කර සිදුවන දැව හානිය අවම කර ගනිමින් නිෂ්පාදන කටයුතු සඳහා යොදා ගැනීමට හෝ අලෙවි කිරීමට කටයුතු කළ යුතුය. |

**3.5 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.2.2 මාර්ගෝපදේශය ප්‍රකාරව සීමිත ජාතික මිල කැඳවීමේ දී අවම වශයෙන් දින 21 ක ලංසු කාලයක් ලබා දිය යුතු වුවත්, කුරුණෑගල පොල්පිතිගම බීට්ටුවේ හෙක්ටයාර් 6 ක්වූ 01/008 C වැඩබිමෙහි තේක්ක ගස් 1720 ක් හෙළීම සම්බන්ධයෙන් අවස්ථා 03 කදී ලංසු කැඳවා අවස්ථා 02 දී නියමිත කාලයට වඩා අඩු ලංසුකාලයක් ලබා දී තිබුණු අතර පළමු ලංසු කැඳවීමේදී තෝරාගත් නමුත් ගිවිසුම්ගත නොවූ ලංසුකරුටම තෙවන ලංසු කැඳවීමේ දී ඒ වන විට ඉවත් කර තිබූ ගස් 290 ක් ද සමඟ සම්පූර්ණ ගස් ප්‍රමාණයම ඉවත් කිරීමට කොන්ත්‍රාත්තුව පිරිනැමීම මතභේදාත්මක කරුණක් බවට නිරීක්ෂණය කෙරේ. | මීට අදාළ විමර්ෂණ කටයුතු සඳහා අදාළ ලිපිගොනු සියල්ලම අල්ලස් හෝ දූෂණ විමර්ෂණ කොමිෂන් සභාව වෙත භාරදී ඇති බැවින්, ඒ සඳහා පිළිතුරු ලබාගැනීමට නොහැකි වී ඇති අතර අල්ලස් හෝ දූෂණ කොමිෂන් සභාව වෙත ගොස් විගණන විමසුමට අදාළ තොරතුරු හා අවශ්‍ය ලේඛනවල ඡායාපිටපත් ලබාගෙන මාවෙත ඉදිරිපත් කරන ලෙස ප්‍රාදේශීය කළමනාකාර (කුරුණෑගල) වෙත දන්වා ඇත. | 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කර ඇතිවිය හැකි අක්‍රමිකතා වලක්වා ගැනීමට ශක්තිමත් පාලන ක්‍රමයක් ස්ථාපිත කළ යුතුය. |

**3.6 ප්‍රසම්පාදන කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.7.7, 2.8.5, 2.11.3 සහ 6.3.1(අ) යන මාර්ගොපදේශයන්ට පටහැනිව විධිමත් ප්‍රසම්පාදන කමිටුවක් හා තාක්ෂණික ඇගයීම් කමිටුවක් පත් නොකොට ෆැක්ස් මඟින් මිල ගණන් ලබා ගෙන අවස්ථා 03 කදී බුස්ස නිෂ්පාදනාගාර සංකීර්ණයට රු.1,101,875 ක් වටිනා භාණ්ඩ මිල දී ගෙන තිබුණි. | බූස්ස සංකීර්ණයේ මුද්‍රිත මිලගණන් විවෘත කිරීමට සහ ප්‍රසම්පාදන මණ්ඩලයේ කටයුතු කිරීම සඳහා වෙන වෙනම කමිටු දෙකක් පැවතිය යුතු බවට ලබා දී ඇති උපදෙස් අනුව ප්‍රසම්පාදන කටයුතු මේ වන විට සිදුවේ. ඉතා හදිසි මිලදීගැනීම් සඳහා ෆැක්ස් මඟින් මුද්‍රිත මිලගණන් ලබාගැනීමට සිදුවූ අතර, මෙය ඉදිරියේදී නිවැරදි කිරීමට ද කටයුතු යොදන බව දන්වමි. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ උපදේස්වලට අනුකූලව ප්‍රසම්පාදන කටයුතු සිදු කළ යුතුය. |

**3.7 මානව සම්පත් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පුහුණුවීම් සඳහා නිලධාරීන් තෝරා ගැනීමේදී නිශ්චිත ප්‍රතිපත්තියක් අනුගමනය නොකිරීම හේතුවෙන් එකම පිරිසක් පමණක් සෑම වර්ෂයකම විවිධ පුහුණු පාඨමාලා සඳහා සහභාගී වී තිබුණි. ඒ හේතුවෙන් සංස්ථා නිලධාරීන්ගේ දැනුම හා කුසලතා වර්ධන ක්‍රියාවලිය විධිමත්ව සිදු නොවන බව නිරීක්ෂණය විය. | කාණ්ඩ තුනක් යටතේ පුහුණුවීම් සඳහා සියලුම සේවකයන් ආවරණය වන පරිදි පුහුණු කටයුතු කිරීමට වර්ෂය මුලදී දැනුම්දීම් අනුව අවශ්‍ය පුහුණුවීම් ලබාදෙන දෙනු ලබයි. වර්ෂය තුළ ආයතනයේ සේවා අවශ්‍යතාවය මත හඳුනාගන්නා පුහුණුවීම් සඳහා ද සේවකයන් යොමුකිරීමට කටයුතු කරනු ලැබේ. | පුහුණුවීම් සඳහා නිලධාරීන් තෝරා ගැනීම සඳහා විධිමත් හා නිශ්චිත ප්‍රතිපත්තියක් සකස් කළ යුතු අතර නිලධාරීන්ට පුහුණු වීම් අනිවාර්ය කළ යුතුය. |